**මැදදුම්බර ප්‍රාදේශීය සභාව - 2020**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී තෙල්දෙණිය මධ්‍යම පුස්තකාලය වැඩිදියුණු කිරීම වෙනුවෙන් දරා තිබූ රු.500,000 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු කර්මාන්ත ණයහිමි ශේෂය රු.448,479 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ඇති ස්ථාවර තැන්පතු වටිනාකම රු.28,400,510 ක් ලෙස දක්වා තිබුණද මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති උපලේඛන අනුව වර්ෂයට අදාළ පොළියත් සමඟ වටිනාකම රු.33,818,178 ක් වීමෙන් රු.5,417,668 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |

### 1.6.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 04 කට අදාළ එකතුව රු.100,192,671 ක් ලේඛන, උපලේඛන හා ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | විගණනයට අවශ්‍ය සියලු තොරතුරු ඉදිරිපත් කළ යුතු වීම. |

### 1.7 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 (අ) වගන්තිය යටතේ නිකුත්කර ඇති අංක 1533/16 හා 2008 ජනවාරි 25 දිනැති පාරිසරික හා ස්වාභාවික සම්පත් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍රය | පරිසර බලපත්‍ර ලබා ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ලද ඉල්ලුම්පත්‍ර 05 ක් සඳහා කමිටු නිර්දේශය ලැබී මාස 01 සිට 04 දක්වා කාලයක් ගතවී තිබුණද බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට බලපත්‍ර 02 ක් යාවත්කාලීන කිරීම ද කර නොතිබුණි. | ඉදිරියේදී බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කරමි. | පනතේ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.22,594,073 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,989,546 ක් විය. එයට ප්‍රධාන වශයෙන් සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 36 කින් වැඩි වී තිබීම බලපා තිබුණි.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් | | |
| | සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවති රු.1,245,937 ක් වූ හිඟ ශේෂයෙන් රු.783,361 ක් ද, රු.1,474,067 ක වර්ෂයේ බිල්කිරීම් වලින් රු.564,106 ක් ද ලෙස එකතුව රු.1,119,815 ක් අයකර ගෙන නොතිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | අක්කර බදු | | |
| | සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවති රු.122,322 ක් වූ හිඟ ශේෂයෙන්, වර්ෂය තුළදී රු.41,025 ක් පමණක් අයකරගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු.93,982 ක ශේෂයක් අයවිය යුතුව පැවතුණි. එම ශේෂය තුළ වර්ෂයක කාලයක් ඉක්මවූ රු.81,297 ක් වූ ශේෂ ඇතුළත්ව තිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | බලපත්‍ර ගාස්තු | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතන 410 කින් හිඟහිටි බලපත්‍ර ගාස්තු රු.283,800 ක්, කර්මාන්ත බදු රු.64,250 ක් හා ව්‍යාපාර බදු රු.56,400 ක් අයකර ගෙන නොතිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | වෙනත් ආදායම් | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට පැවති රු.1,884,715 ක හිඟ රථ වාහන කුලී ආදායමෙන් රු.1,631,995 ක් ද සමාලෝචිත වර්ෂයේ බිල්කල රු.742,545 කින් රු.418,040 ක්ද ලෙස එකතුව රු.2,050,035 ක් අයකර ගෙන නොතිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවති රු.874,247 ක හිඟ ජල ගාස්තු ශේෂයෙන් රු.337,965 ක් ද සමාලෝචිත වර්ෂයේ බිල් කළ රු.3,365,311 ක ආදායමෙන් රු.1,089,751 ක් ද ලෙස එකතුව රු.1,427,716 ක් අයකර ගෙන නොතිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තෙල්දෙණිය බස් නැවතුම්පලෙහි කඩ කාමරය තෙල්දෙණිය ඩිපෝවේ රියදුරු හා කොන්දොස්තර මහතුන්ගේ විවේක කාමරයක් ලෙස 2017 දෙසැම්බර් 17 දින ලබා දී තිබීමෙන් ඉකුත් වර්ෂයේදී රු.501,500 ක් සහ සමාලෝචිත වර්ෂයේදී රු.501,500 ක ආදායමක් අහිමි වී තිබුණ ද එම කඩ කාමර ආපසු ලබාගෙන නොතිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. | නිසි අනුමැතියකින් තොරව සභාව සතු වත්කම් වෙනත් පාර්ශවයන්ට ලබා නොදීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | තෙල්දෙණිය නගරයේ ඉදිකිරීමට යෝජිත පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 170 ක් ඉදිකිරීමට සැලසුම් කර බදුකරුවන් 93 දෙනෙකුගෙන් එක්වන් මුදල් ලෙස රු.27,600,000 ක මුදලක් ලබාගෙන තිබුණි. කඩ කාමර වෙන් කිරීමේ ගැටළුවක් මත බදුකරුවන් 22 නෙකු විසින් සභාවට විරුද්ධව නඩු පැවරීම හේතුවෙන් ඉකුත් හා සමාලෝචිත වර්ෂයන් තුළදී රු.435,000 ක මුදලක් නීතිඥ ගාස්තු වශයෙන් දැරීමට සිදුවී තිබූ අතර ලබාගෙන තිබූ එක්වන් මුදලින් රු.1,260,000 ක් බදුකරුවන් 13 දෙනෙකුට නැවත ගෙවීමට ද සිදුවී තිබුණි. | වාරණ නියෝග පවතින බැවින් ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීමට නොහැකි වී ඇති බව. | ආදායම් වැඩි කර ගැනීමට කටයුතු කළ යුතු වීම හා නීති, රීතිවලට අනුකූලව කටයුතු කිරීම තුළින් අධිකරණමය කටයුතු වලට මැදිහත් නොවීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 1ත් 5ත් අතර කාලයක් ඉක්මවා තිබූ රු.115,161,590 ක් ද වසර 5 කට වඩා වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොවූ රු.5,358,465 ක් ද ඇතුළත් එකතුව රු.120,520,055 ක් වන කර්මාන්ත ණයගැති හා විවිධ ණයගැති ගිණුම් ශේෂ 2 ක් අයකර ගෙන නොතිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. | නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 1 - 5 ත් අතර කාලයක් තිස්සේ නිරවුල් නොකළ රු.92,592,419 ක් ද වසර 5 ක කාලයක් ඉක්මවා තිබූ රු.3,233,059 ක් ද ඇතුළත් එකතුව රු.95,825,472 ක් වන කර්මාන්ත ණයහිමි, විවිධ ණයහිමි හා ගබඩා ණයහිමි ගිණුම් ශේෂ අයකර ගෙන නොතිබුණි. | ඉදිරියේදී අයකර අයකර කටයුතු කරමි. | නොපමාව නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු 16 ක් සඳහා බඳවා ගැනීම් සිදුකර නොතිබුණි. | ඉදිරියේදී පුරප්පාඩු පිරවීමට කටයුතු කරමි. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. |